ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ
**ප්‍රවෘත්ති නිවේදනය**
මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 249-8100 ● ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20210611

## *MV X-Press Pearl* භාණ්ඩ නෞකාවේ ගින්න හේතුවෙන් පීඩාවට ලක් වූ ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් එක්සත් ජනපදයෙන් මානුෂීය ආධාර ලබාදේ

2021 ජුනි 11 වැනි දින, කොළඹ දී: *MV X-Press Pearl* නෞකාවේ ගින්න සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට දරන වෑයම්වලට උපකාර පිණිස කඩිනමින් ඩොලර් 100,000ක ආධාරයක් ලබාදීමට ඇමරිකානු ජනතාව කටයුතු කර තිබේ. වෙරළබඩ සම්පත් සහ ආසන්නයේ ධීවර ප්‍රජාවන්ගේ ජීවනෝපායන් අනතුරේ හෙළමින් *MV X-Press Pearl* නෞකාවෙන් ප්ලාස්ටික් කැබලි සහ රසායන ද්‍රව්‍ය අවට මුහුදට මුදාහැර තිබේ.

ලබාදෙන මෙම ආධාරයෙන්, මෙම හදිසි අවස්ථාව හේතුවෙන් තමන්ගේ ජීවනෝපාය  බලපෑමට ලක් වූ පවුල්වලට කඩිනමින් උපකාර ලබාදෙනු ඇති අතර ප්‍රතිචාර සම්බන්ධීකරණය සහ කළමනාකරණය සඳහා දැනට ලබාදෙමින් පවතින සහය තවදුරටත් පුළුල් කරනු ඇත. එක්සත් ජනපදය මෙම ආධාර ලබාදෙන්නේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එ.ජ. නියෝජිතායතනයේ (USAID) ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් හරහා වේ.

"*MV X-Press Pearl* ගින්න හේතුවෙන් ඇති වූ පාරිසරික බලපෑම්වල හානි අඩුකරගැනීම සඳහා උපකාර කිරීමට එක්සත් ජනපදය කැපවී සිටිනවා," එ.ජ. තානාපති කාර්යාල කටයුතුභාර නිලධාරි මාර්ටින් කෙලී මහතා පැවසුවේ ය. "කඩිනමින් ලබාදෙන මෙම ආධාරය, ජීවනෝපාය උපකාර ලබාදෙමින් දැනට ඇතිවෙමින් පවතින තත්වයට මුහුණදීම සඳහ ධීවර ජනතාව සහ ඔවුන්ගේ පවුල්වල අයට හැකියාව ලබාදෙනු ඇති."

සමුද්‍රීය ආපදා ප්‍රතිචාර ඇතුළුව හදිසි අවස්ථාවලදී ප්‍රතිචාර දැක්වීම සඳහා දේශීය ශක්‍යතා වර්ධනය කිරීම සඳහා එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් වසර ගණනාවක සිට කටයුතු කර තිබේ. ගංවතුර සහ නායයෑම්වල හානි අඩුකරගැනීමටත් ඒවා කළමනාකරණයටත් උපකාර කිරීම සඳහා සහ ආපදාවලට වඩාත් හොඳින් සූදානම්වීම හා යථා තත්වයට පත්වීම සඳහා ප්‍රජාවන්ට හැකියාව ලබාදීම සඳහා USAID, එ.ජ. වනාන්තර සේවය, සහ එ.ජ. ආරක්ෂක දෙපාර්තමේන්තුව ද අරමුදල් ලබා දෙනු ලැබේ.